# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல்கள் ஆணைக்குழு


පොදු කාර්යාලය : **011-2868441, 2868442, 286844**
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : **011-2868426**

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය **(10107)**
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய **(10107)**

***web : www.slelections.gov.lk*** ***e-mail : info@slelections.gov.lk***


මගේ අංකය : EC/EDR/LAE/2023/04B ඔබේ අංකය : දිනය : 2023.01.07
எனது இல. உமது இல. திகதி

**චක්‍රලේඛ අංක 28**

සියළුම පළාත් පාලන කොමසාරිස්වරු/ සහකාර පළාත් පාලන කොමසාරිස්වරු වෙත

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023**
**පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම**

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක EC/EDR/LAE/2023/04B හා 2023.01.05 දිනැති චක්‍රලේඛ අංක 20 කෙරෙහි හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ අංක 2313/3? දරන හා 2023.01.04 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිඑක්වන ව්‍යවස්ථා සංශෝධනයේ 104 (ආ) (4) (අ) ව්‍යවස්ථා අනුව “මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්” යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත සභාපතිවරයාට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට පවතී. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන එවැනි විධානයකට අනුකූලවීම සහ ක්‍රියාත්මක කිරීම තත් කාලයේ රජය සතු දේපළ භාරව සිටින හෝ පාලනය දරන සියළුම නිලධාරීන් බැඳී සිටී. එවැනි විධානයක් උල්ලංඝනය කිරීම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූවිට වසර තුනක සිර දඬුවමක් හෝ රුපියල් ලක්ෂයක දඩයකින් හෝ එකී දඬුවම් ද්විත්වයම ලබාදීමට හැකි වරදක් බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ම හඳුන්වා දී ඇති බව ද අවධාරණය කරමි.

03. එබැවින් ඉහත කරුණු කෙරෙහි අවධානය යොමු කර එහි සඳහන් කරුණු තරයේ පිළිපැදීමට ක්‍රියාකරන ලෙස සහ ඡන්ද විමසීම් කාල සීමාව තුළ කිසිදු පක්ෂ/ අපේක්ෂකයකු ප්‍රවර්ධනය පිණිස හෝ අගතියට පත්වන ආකාරයට ක්‍රියාකිරීම හෝ ඒ වෙනුවෙන් ආයතන සතු නිශ්චල හා චංචල දේපළ භාවිතා කිරීමෙන් වළකින ලෙස හා සියළුම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සහ පරිපාලන නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලෙස දන්වා සිටිමි

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත්:

01. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව - දැනගැනීම පිණිස හා අවශ්‍ය කටයුතු සඳහා
02. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරු } දැනගැනීම පිණිස හා අවශ්‍ය කටයුතු සඳහා


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : chairman@elections.gov.lk*

මැතිවරණ කොමසාරිස් ජනරාල්
*தேர்தல்கள் ஆணையாளர் நாயகம்*
දුරකථන/தொலைபேசி : 0112885207
ෆැක්ස්/தொலைநகல் : 0112885208
*e-mail : cge@elections.gov.lk*
*dgelection@elections.gov.lk*

අතිරේක මැතිවරණ කොමසාරිස්
(නීති හා විමර්ශන)
மேலதிக தேர்தல்கள் ஆணையாளர்
(சட்டம் மற்றும் விசாரணைகள்)
දුරකථන/தொலைபேசி: 011-2867471
ෆැක්ස්/தொலைநகல்/Fax : 011-2868448